# NIKE, Inc. චර්යාධර්ම සංග්‍රහය

අවසන් රේඛාවක් නොතිබුණත්, Nike හි අප විශ්වාස කරනුයේ පැහැදිලි ආරම්භක රේඛාවක් තිබෙන බවය.

කොන්ත්‍රාත්තු කම්හල් සමඟ වන අපගේ කටයුතු හැම විටම වෙනස් වන බව අවබෝධ කර ගෙන, මෙම චර්යාධර්ම සංග්‍රහය අපගේ කම්හල් සැපයුම්කරුවන් පිළිබඳව අප සතු අපේක්ෂණ පැහැදිලි කර ප්‍රවර්ධනය කරන අතර එකිනෙක කම්හල් සපුරාලිය යුතු *අවම* ප්‍රමිති සකස් කරමු.

අප Nike inc වෙත, මූලාශ්‍ර උපායමාර්ග වෙත ප්‍රවේශ වන ආකාරය, අප කම්හල් කාර්යසාධන තක්සේරු කරන ආකාරය සහ Nike සමාගම කුමන කම්හල් සමඟ අඛණ්ඩව කටයුතු කර අපගේ ව්‍යාපාරය සංවර්ධනය කිරීමට තීරණය කරන්නේ කෙසේද යන්න බැලීම මෙම ප්‍රමිති භාවිතා කිරීමේ අභිමථාර්ථය වේ.

මූලාශ්‍රකරණය සහ නිෂ්පාදනය තුළ අපි අපගේ ව්‍යාපාරය ආදර්ශනය කරන විට, මෙම අවම ප්‍රමිති සපුරාලීම නිෂ්පාදන නායකත්වය, අඛණ්ඩ ප්‍රවර්ධනය සහ ස්වයං-පාලනය වෙනස් විය යුතු වැදගත් පාද රේඛාවක් බව වටහා ගන්නා කම්හල් සමඟ කටයුතු කිරීමට අපි බලාපොරොත්තු වෙමු.

මෙම චර්යාධර්ම **සංග්‍රහයෙන් ඔබ්බට, වඩා පිරිමැසුම්දායක, පරිසර හිතකාමී, වඩා සවිබල ගැන්වුණු සහ සාධාරණ** සැපයුම් දාමයක් ස්ථාපිත කිරීමට උපකාරී වනු පිණිස, අපගේ කොන්ත්‍රාත්තු කම්හල් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට Nike කැප වී සිටී. අප කටයුතු කරන රටවල කම්කරු සහ පාරිසරික තත්වයන්වලට ක්‍රමානුකූල වෙනස්කමකට බලපෑමක් ඇති කිරීමට සිවිල් සමාජයට, රජයන්ට, සහ පෞද්ගලික අංශය සමඟ අඛණ්ඩව නියැළී සිටීමට අපි කටයුතු කරමු.

අපගේ කොන්ත්‍රාත් කම්හල්, නාස්තිය අඩු කිරීම, සම්පත් වගකීමෙන් යුක්තව භාවිතා කිරීම, සේකයන්ගේ අයිතිවාසිකම්වලට සහාය ලබා දීම, සහ සේවකයන්ගේ සහ ප්‍රජාවේ සුභසාධනය උසස් කිරීම සඳහා Nike හි කැපවීම බෙදාහදා ගැනීමට අපි අපේක්ෂා කරමු. විනිවිදභාවය, සුහදතාවය සහ අන්‍යොන්‍ය ගරුත්වය මත පදනම් වූ හවුල්කාරත්වයන් මෙය සිදු කිරීමට හැකි කිරීම සඳහා වන අනිවාර්ය අංගය බවට අපි විශ්වාස කරමු.

අපගේ චර්යාධර්ම සංග්‍රහය මඟින් අපගේ කොන්ත්‍රාත්තු කම්හල් මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා අනිවාර්ය යැයි අප විශ්වාස කරන පහත දැක්වෙන නිශ්චිත අවම ප්‍රමිතිවලට බැඳ තබයි.

## රැකියාව ස්වේච්ඡා එකකි

කොන්ත්‍රාත්කරු විසින් සිරකරුවන්ගේ ශ්‍රමය, බලහත්කාර ශ්‍රමය, හෝ බන්ධිත ශ්‍රමය හෝ වෙනත් ආකාරයක බලෙන් ලබා ගන්නා ශ්‍රමයක් භාවිතා නොකරයි. කොන්ත්‍රාත්කරු විදේශීය සේවකයන්ගේ, බඳවා ගැනීමේ ගාස්තුද ඇතුළුව රැකියාවලට සුදුසුකම් ලබා ගැනීමේ ගාස්තු සඳහා වගකීම දරයි.

## සේවකයින් වයස අවුරුදු 16 හෝ ඊට වඩා වැඩි අය වේ

කොන්ත්‍රාත්කරුගේ සේවකයින් අඩු වශයෙන් වයස අවුරුදු 16 හෝ අනිවාර්ය අධ්‍යාපනය සම්පූර්ණ කිරීමේ වයස හෝ රටේ නීතිමය වැඩ කිරීමේ වයස, යන දෙකෙන් ඉහළ වයසට වඩා වැඩි අය වේ. අවුරුදු 18 ට වඩා අඩු සේවකයින් අනතුරුදායක තත්වයන් තුළ සේවයේ නියුක්ත කරනු නොලැබේ.

## කොන්ත්‍රාත්කරු වෙනස් කොට නොසලකයි

කොන්ත්‍රාත්කරුගේ සේවකයින් ස්ත්‍රී පුරුෂ භාවය, ජාතිය, ආගම, වයස, ආබාධිතභාවය, ලිංගික කැමැත්ත, ගර්භණීභාවය, විවාහක අවිවාහක තත්වය, ජනවාර්ගිකත්වය, දේශපාලන අදහස්, වෘත්තීය සමිති හා අනුබද්ධිත සමිති සමාජ හෝ ජනවාර්ගික සම්භවය හෝ රටේ නීතිය මඟින් ආරක්ෂිත වෙනත් කිසියම් තත්වයක් මත පදනම්ව කුළියට ගැනීම, වැටුප් ගෙවීම, උසස් කිරීම හෝ ශ්‍රේණිකරණය ඇතුළුව සේවා නියුක්ත කිරීමේදී වෙනස් කර සැලකීමකට යටත් නොවේ.

## සංගමයේ නිදහස සහ සාමූහිකව කේවල් කිරීමට ගරු කරනු ලැබේ

නිෂ්පාදනය කරන රටේ ඉඩ ලබාදී ඇති උපරිම ප්‍රමාණයට, සංගමයේ නිදහසට සහ සාමූහික කේවල් කිරීම සඳහා සේවකයන් සතු අයිතිය හඳුනා ගෙන ගරු කරනු ලැබේ. මීට වෘත්තීය සමිතියක් සහ වෙනත් සේවක සංවිධානයකට තමන් විසින්ම හිරිහැර කිරීමකින්, බාධා කිරීමකින්, හෝ පළිගැනීමකින් තොරව ආරම්භ කිරීමට සහ බැඳීමට ඇති අයිතිය ඇතුළත් වේ.

## ගෙවීම් කටයුතු නිසි වේලාවට සිදු කෙරේ

කොන්ත්‍රාත්කරුගේ සේවකයන්හට රටේ නීතිය මඟින් නියම කර ඇති අවම වැටුපවත් නිසි වේලාවට ගෙවනු ලබන අතර, විවේක සහ නිවාඩු සහ නීත්‍යානුකූලව අනිවාර්ය කර ඇති ප්‍රතිලාභ ලබා දෙන අතර සේවය අවසන් කරන විට විනය කඩ කිරීමේ ක්‍රියාවන් සඳහා දඩ මුදල් අය කරනු නොලබයි. වැටුපෙන් විනයානුකූල අඩු කිරීම් සිදු කරනු නොලැබේ.

## හිරිහැර සහ අතවර ඉවසනු නොලැබේ

කොන්ත්‍රාත්කරුගේ සේවකයින්හට ගරුත්වයකින් සහ ගෞරවයෙන් යුක්තව සලකනු ලැබේ. සේවකයින් ශාරීරික, ලිංගික, මනෝවිද්‍යාත්මක හෝ වාචික හිරිහැර කිරීම්වලට හෝ අපහරණයන්වලට භාජනය නොකෙරේ.

## වැඩකරන පැය ගණන වැඩි නොවේ

කොන්ත්‍රාත්කරුගේ සේවකයින් සතියකට පැය 60ක්, හෝ නිෂ්පාදනය කරන රටේ නීති මඟින් ඉඩ දී ඇති නිත්‍ය අතිකාල පැය ගණන හෝ, මේ දෙකෙන් අඩු එකට කට වඩා වැඩියෙන් වැඩ නොකරයි. කිසියම් අතිකාල වැඩ පැය ගණන් සඳහා ගෙවීම් කරනු ලබන්නේ නීතිමය වශයෙන් නියම කර ඇති වාරික අනුපාතය යටතේ වේ. සේවකයින්හට සෑම දින හතකට වරක්ම අඩු වශයෙන් පැය 24ක අඛණ්ඩ විවේක පැය සංඛ්‍යාවක් ලබා දිය යුතුය.

## නිත්‍ය සේවා නියුක්තියක් සපයනු ලැබේ

රටේ නීතිය සහ පරිචය තුළින් ස්ථාපිත කර ඇති පිළිගත්සේවා නියුක්ත සම්බන්ධතා මත පදනම්ව වැඩ ඉටු කරනු ලැබේ. කොන්ත්‍රාත්කරු විසින් Nike වෙළඳනාමය හෝ අනුබද්ධ භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා කොන්ත්‍රාත්කරු කිසිදු ආකාරයක නිවසේදී වැඩ කරන වැඩ පිළිවෙලක් භාවිතා නොකරයි.

## සේවා ස්ථානය සෞඛ්‍ය සම්පන්න හා ආරක්ෂිත වේ

කොන්ත්‍රාත්කරු විසින් ආරක්ෂිත, පිරිසිදු හා සෞඛ්‍ය සම්පන්න සේවා ස්ථාන පසුබිමක් ලබා දෙන අතර කොන්ත්‍රාත්කරුගේ කම්හල්වල ක්‍රියාත්මක වීම හේතුවෙන් වැඩ කරන අතරතුර ඇති වන, සම්බන්ධිත හදිසි අනතුරු සහ තුවාල වැළැක්වීමට අවශ්‍ය පියවර ගනු ලැබේ. සියලු සේවකයින්ගේ ආරක්ෂාවට සහ සෞඛ්‍යයට ඇති විය හැකි අනතුරු සොයා ගැනීමට, මඟ හැරීමට සහ ප්‍රතිචාර දැක්වීම සඳහා වන වැඩ පිළිවෙලක් තිබේ.

## පාරිසරික බලපෑම අවම කෙරේ

වායු මුක්ත කිරීම්, ඝන/අනතුරුදායක අපද්‍රව්‍ය සහ ජල අපවහනය ඇතුළු අදාළ නියාමන අවශ්‍යතා සපරාලමින් කොන්ත්‍රාත්කරු මානව සෞඛ්‍යය සහ පරිසරය ආරක්ෂා කරයි. පරිසරය හා සම්බන්ධ අහිතකර ක්‍රියාත්මක බලපෑම් අවම කිරීමට කොන්ත්‍රාත්කරු විසින් සාධාරණ ක්‍රියාමාර්ග අනුගමනය කරන අතර පාරිසරික ක්‍රියාකාරීත්වය වැඩිදියුණු කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

## චර්යාධර්ම සංග්‍රහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කෙරේ

Nike සමඟ ව්‍යාපාරික කටයුතු කිරීමේ කොන්දේසියක් ලෙස, Nike හි *නායකත්ව ප්‍රමිති සංග්‍රහයේ* වැඩි දුරටත් විස්තර කර ඇති පරිදි, සහ එහි ව්‍යාපාරි පැවතුම්වලට අනුකූලව සහ තහවුරු කිරීමට සහ විමර්ශනයට යටත්ව කොන්ත්‍රාත්කරු විසින් මෙම ඒකාබද්ධ චර්යාධර්ම සංග්‍රහ ක්‍රියාත්මකර කරනු ලබයි. කොන්ත්‍රාත්කරු විසින් මෙම සංග්‍රහය, එහි සේවකයන්ගේ භාෂාවෙන් (වලින්), සියලුම සේවා ස්ථානවල පළ කරනු ලබයි; මෙම චර්යාධර්ම සංග්‍රහය සහ අදාළ රටේ නීතියෙන් අර්ථ දක්වා ඇති පරිදි ඔවුන්ගේ හිමිකම් සහ බැඳීම් සම්බන්ධයෙන් සේවකයන් පුහුණු කරයි; Nike වෙළඳ ලකුණ හෝ අනුබද්ධිත භාණ්ඩ නිෂ්පාදනය කරන කිසියම් උප-කොන්ත්‍රාත්කරුවන්ගේ අනුකූලතාවය සහතික කරනු ලබයි.